# මානව සම්පත් අභිවර්ධන ආයතනය
# කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - III කොටස - 2013
(දෙවන සෙමෙස්තරය)

(පවත්වන ලද්දේ 2015 මාර්තු)

## BLE 309 - ආර්ථික ප්‍රතිපත්ති සහ ශ්‍රී ලංකාවේ සංවර්ධනය

**අයදුම්කරුවන්ට උපදෙස් :**

(1) ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

(2) කාලය පැය තුනයි. (03)

(3) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න අටකින් (08) සහ පිටු තුනකින් (03) සමන්විතවේ.

(4) උත්තර පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) විභාගය අවසානයේදී සියලුම උත්තර පත්‍ර එකට ගැට ගැසිය යුතුය.

(6) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

01. (i) ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය තීරණය කරන ප්‍රධාන සාධක මොනවාද?

(ලකුණු 05)

(ii) රටක හොඳ ආර්ථික වර්ධන වේගයක් හඳුනා ගැනීමේ ලක්ෂණ මොනවාද?

(ලකුණු 05)

(iii) ශ්‍රී ලංකාවේ සංවර්ධන මට්ටම නිවැරදිව නිරූපනය කිරීම සඳහා යොදාගත හැකි දර්ශක පහක් නම් කරන්න.

(ලකුණු 05)

(iv) ශ්‍රී ලංකාවේ ආර්ථික ව්‍යුහයේ මෑතකාලීන වෙනස්කම් පහක් හඳුනා ගන්න.

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

02. (i) ප්‍රමාණාත්මක ආදායම් ව්‍යාප්ති සහ මූලාශ්‍ර ආදායම් ව්‍යාප්තිය අතර වෙනස පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(ii) රටක ආදායම් ව්‍යාප්තියේ විෂමතාවයන් මැනීම සඳහා භාවිතා කළ හැකි දර්ශක පහක් (05) කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(iii) ශ්‍රී ලංකාවේ ආදායම් ව්‍යාප්තියේ ලක්ෂණ පහක් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(iv) මෙරට ආදායම් විෂමතාවය අවම කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග මොනවාද?

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

03. (i) ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටක් රෙදිපිළි හා ඇඟළුම් වැනි එක් ප්‍රධාන ආරථික අපනයන භාණ්ඩයක් මත රැඳී සිටීමේ අවධානම පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(ii) සංවර්ධනය වෙමින් පවතින රටක අපනයන ප්‍රවර්ධනය සඳහා ගත හැකි ක්‍රියාමාර්ග මොනවාද?

(ලකුණු 05)

(iii) ශ්‍රී ලංකාවේ ආනයන සංයුතියේ මෑත කාලීන ස්වරූපය පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(iv) ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටකට ආනයන ආදේශනය කිරීමේ වැදගත්කම පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

04. (i) කේන්ඩියානු ඉතුරුම් න්‍යායේ ප්‍රකාශවන ඉතුරුම් සඳහා වන කරුණු අට(08) කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(ii) රටකට ආයෝජනය වැඩිකිරීම සඳහා ගත හැකි ප්‍රධාන ක්‍රියාමාර්ග පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(iii) ඉතුරුම් හා ආයෝජන පිළිබඳ ඔබ දන්නා න්‍යායන් දෙකක් සඳහන් කොට ඒවා ශ්‍රී ලංකාව සඳහා කොතෙක්දුරට යොදා ගත හැකිදැයි පෙන්වා දෙන්න.

(ලකුණු 05)

(iv) ශ්‍රී ලංකා මහබැංකු පොලී අනුපාතය වෙනස් කිරීමේ ආර්ථික ප්‍රතිවිපාක මොනවාද?

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

05. (i) විදේශ විනිමය වෙළෙඳ පොළෙහි සිටින ගණුදෙනු කරුවන් හඳුනා ගන්න .

(ලකුණු 05)

(ii) රටක විදේශ විනිමය ඉල්ලුමට සහ සැපයුමට බලපාන ප්‍රධාන කරුණු මොනවාද?

(ලකුණු 05)

(iii) පාවෙන විනිමය අනුපාත ක්‍රමයෙන් සංවර්ධනය වන රටකට ලබාගත හැකි වාසි මොනවාද?

(ලකුණු 05)

(iv) විදේශ විනිමය අනුපාතය අවප්‍රමාණය කිරීමෙන් ශ්‍රී ලංකාවේ ආර්ථිකයට ඇතිකළ හැකි බලපෑම කුමක්ද?

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

06. (i) සංවර්ධනය වෙමින් පවතින රටක දිළිඳුකම ඇති කිරීමට හේතුවන කරුණු මොනවාද?

(ලකුණු 05)

(ii) දිළිඳුකම නිර්වචනය කොට එය මැනීම සඳහා යොදා ගන්නා දර්ශක පහක් (05) පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(iii) ශ්‍රී ලංකාවේ දිළින්ඳන්ගේ ලක්ෂණ මොනවාද?

(ලකුණු 05)

(iv) ශ්‍රී ලංකාවේ දිළිඳුකම තවදුරටත් අවම කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග මොනවාද?

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

07. (i) සංවර්ධනය වෙමින් පවතින රටක ඉහල උද්ධමනයක් පවතින විටෙක එහි ආර්ථික කටයුතු කෙරෙහි ඇතිකරන බලපෑම කෙසේද?

(ලකුණු 05)

(ii) සංවර්ධනය වෙමින් පවතින රටක ඉහල උද්ධමනයක් පවතින විටෙක එය පාලනය කිරීම සඳහා ගත හැකි ක්‍රියා මාර්ග මොනවාද?

(ලකුණු 05)

(iii) ශ්‍රී ලංකාවේ මිල මට්ටම මැනීමට භාවිතා කරන මිල දර්ශක දෙකක් තෝරාගෙන ඒවායේ මෑතකාලීන උපනතිය පහදන්න.

(ලකුණු 05)

(iv) ශ්‍රී ලංකාවේ උද්ධමන අනුපාතිකය සහ සේවා වියුක්ති අනුපාතිකය අතර පවතින සම්බන්ධතාවය පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

08. (i) මුල්‍ය ප්‍රතිපත්තිය සහ රාජ්‍ය මුල්‍ය ප්‍රතිපත්තිය අතර වෙනස්කකම් මොනවාද?

(ලකුණු 04)

(ii) ශ්‍රී ලංකාවේ රාජ්‍ය අයවැය ලේඛනයේ කැපී පෙනෙන ලක්ෂණ හතරක් (04) පැහැදිලි කරන්න.

(ලකුණු 04)

(iii) ශ්‍රී ලංකාව සංවර්ධනය කිරීම සඳහා රජයට යොදාගත හැකි ප්‍රධාන ප්‍රතිපත්ති හතරක් (04) යෝජනා කොට ඒවා කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 04)

(iv) ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටකට ගෙවුම්ශේෂයෙහි පවතින හිඟය බලපාන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 04)

(v) ශ්‍රී ලංකාවට හිතකර ජාත්‍යන්තර වෙළෙඳ ප්‍රතිපත්ති යන්නෙන් ඔබ වටහා ගන්නේ මොනවාද?

(ලකුණු 04)

(මුළු ලකුණු 20)